## 262 සමිඳුනි ලස්සන ලොව

සමිඳුනි ලස්සන ලොව ඔබගෙයි
විශ්වය මුළු මෙන් ඔබට නතුයි
මනු හදවත් ඔබ වෙතට ඇදෙයි
හැම ඔබගෙන් බැව් සිතට නැගෙයි

පැසසුම් වේ පැසසුම් වේ
පැසසුම් ගී තුති ඔබට පිදේ

ඔබ පුත් කුමරුන් ලොව එවලා
මේ මගේ ප්‍රිය පුත් යයි කියලා
ඉටු කර ගිවිසුම පෙම් පාලා
අසරණ මා හට අත දීලා

දෙව්පුත් මිනිසත් බව ගත්තා
අප පව් බර කරපිට ගත්තා
කුරුසිය පිට තම පණ දුන්නා
යලි මගෙ ජීවිතෙ පණ ගත්තා